

අතිපූජ්‍ය නා උයනේ අරියධම්ම
ස්වාමින් වහන්සේ විසින් සම්පාදිත

# දවසට වරක්වත් බුදුගුණ සිහි කරමු

උතුම් ධර්මදානයක් ලෙස පිළිගන්වන්නේ බැතියෙනි.

**"සබ්බ දානං ධම්ම දානං ජිනාති."**
සියළු දානයන් අභිබවා ධර්ම දානය ජයගනී.

# දවසට වරක්වත් බුදුගුණ සිහි කරමු

ත්‍රිපිටකාචාර්ය මහා කම්මට්ඨානාචාර්ය
නා උයනේ අරියධම්ම ස්වාමින් වහන්සේ


දිමුතු මුද්‍රණාලය
103/A
නුවර පාර,
යක්කල.
033-5623853
dimuthipub@yahoo.com

# පෙරවදන

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස ///**

**බුදෙධ චිත්තප්පසාදෙන-**
**ධම්මෙ සංඝං ච යො නරො,**
**කප්පානි සත සහස්සානි-**
**දුග්ගතිං සො න ගච්ඡති.** (සංග්‍රහ කථා)

සම්මා සම්බුද්ධ රත්නය කෙරෙහිත්, ධර්ම රත්නය, සංඝ රත්නය කෙරෙහිත් යමෙක් සිත පහදවා ගන්නේ ද, එපමණකින් ඔහු මහා කල්ප ලක්‍ෂයක් දුගතියට නො යයි. සුගතියෙන් සුගතියට යමින් පාරමී සපුරා අමා මහ නිවනට සැපත් වෙයි, යනු ගාථා පාඨයේ අදහසයි.

බුදු ගුණ අනන්තයි, බුදු ගුණ සත්‍යයයි, බුදු ගුණ විද්‍යාමානයි, බුදු ගුණ මහානුභාව සම්පන්නයි, බුදු ගුණ කෙරෙහි පැහැදීමෙන් නිතර බුදු ගුණ සිහි කිරීමෙන් බොහෝ අනුසස් ලැබෙනුයේ නිරායාසයෙනි. බුදු ගුණ නිරතුරුව සිහි කරන තැනැත්තා සුවසේ නිදයි.' සුවසේ අවදිවෙයි. නපුරු සිහින නො දකියි. දෙවියන්ට ප්‍රිය වෙයි. දෙවියන්ගේ ආරක්‍ෂාව ලබයි. වස විස අවි ආයුධ ගිනි විපත් ශරීරගත නො වෙයි. ශරීර වර්ණය පැහැපත් වේ. චිත්ත සමාධිය නො පමාව ලබයි.

ගොවිතැන් සරුසාර වේ. වෙළහෙළදාම් දියුණු වේ. රාජකාරී තනතුරු උසස් බවට පත්වෙයි. පවුලේ සමගිය සෞභාග්‍ය නිරෝගතාව දියුණු වෙයි. සිතේ පිරිසිදුකම නිසා හෘදය වස්තුවෙහි ලේ පිරිසිදු වෙයි. පිරිසිදු ලේ සිරුරෙහි පැතිරීමෙන් ශරීර සෞඛ්‍යය වර්ධනය වෙයි. එමගින් ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥා අභිවර්ධනය වෙයි. මරණාසන්නයේ දී පවා මනා සිහිනුවණින් ගතවෙයි. මතු භවයක් පාසා සම්මා දිට්ඨිය ඇත්තෙක් වෙයි. බිය තැති ගැනීම් නැත්තෙක් වෙයි. බුද්ධ රත්නය ගැන අචල ශ්‍රද්ධාවක් පිහිටයි. ප්‍රීති සොම්නස් බහුල වෙයි. පිට සක්වළක නූපදියි. බුදුකෙනෙකුන් වහන්සේ නමක් පහළ වූ සේක් නම් තමා වෙත වැඩම කරවා ධර්ම දේශනා කොට මග ඵල නිවන අවබෝධ කරවන සේක. මේ ආදී අනේක ආනිසංස ගෙන දෙන බැවින් බුදු ගුණ නිරතුරුව මෙනෙහි කිරීම දෙලොව සුබ සෙත මග ඵල නිවන් සෙත සැලසෙන නිසා බුදු ගුණ භාවිතාව සඳහා ඡන්ද, චිත්ත, විරිය, විමංසාවන් අවදි කෙරෙත්වා යයි ආරාධනා කරනුයේ බුදු ගුණ ආශිර්වාදයෙනි.

'' දවසට වරක්වත් බුදුගුණ සිහි කරමු '' යන මාතෘකාවෙන් සැදැහැවත් ධර්මකාමී පිරිසක් විසින් පළමු වරට මේ දහම් පොත මුද්‍රණය කරවා ධර්මදානය වශයෙන් පිරිනමන ලද්දේ ඥාතීන්ට පින් පෙත පිරිනැමීමේ නිමිත්තෙනි.

මෙම ධර්ම දානමය කුසලානුභාවයෙන් සහ රත්නත්‍රයානුභාවයෙන් සැමට නිදුක් නිරෝගී සුවපත් භාවයෙන් ආයු වර්ණ සැප බල ප්‍රඥාවන්ද ශ්‍රද්ධා ශිල ශ්‍රැත ත්‍යාග ඥාන හිරි ඔත්තප්ප බහුශ්‍රැතතාව පරාක්‍රම වීර්ය ස්මෘති ප්‍රඥාවන් ද පුසපස වැඩෙන පුර සඳමඩල සේ දියුණුවෙන් දියුණුවට පත් වේවා ! ශාන්ති ලක්‍ෂණ නිර්වාණ ධාතුව සුවසේ ම සාක්‍ෂාත් වේවා !

**'' සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා ''**

මෙයට, මෙතැති,

**පූජ්‍ය නා උයනේ අරියධම්ම ස්ථවිර,**
නා උයන ආරණ්‍ය සේනාසනය,
පන්සියගම.

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස ///**

## අරහං බුදු ගුණය

**සො භගවා ඉතිපි අරහං**
**අරහං වත සො භගවා**
**තං භගවන්තං අරහන්තං සරණං ගච්ඡාමි**
**තං භගවන්තං අරහන්තං සිරසා නමාමි**

★ ස්වාමීනි ! භාග්‍යවතුන් වහන්ස ! අවිද්‍යා, සංඛාර, විඥාණ, නාමරූප, සළායතන, එස්ස, වේදනා, තණ්හා, උපාදාන, ජාති, ජරා, ව්‍යාධි, මරණයන් ඉක්ම වූ හෙයින් ද,

★ ස්වාමීනි ! භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ යසස, කීර්තිය, ධනය, බලය, ශීල, සමාධි, ප්‍රඥා, ධ්‍යානා දී කිසි දෙයකින් මානයෙන් උඩඟු නොවූ හෙයින් ද,

★ දිව්‍ය, බ්‍රහ්ම, මනුෂ්‍ය ආදීන්ගේ ආමිෂ, ප්‍රතිපත්ති පූජාවන්ට සුදුසු වූ හෙයින් ද,

★ රහසින්වත් පවක්, අති පාරිශුද්ධ චිත්ත සන්තානයෙන් සිදු නොකළ හෙයින් ද,

★ ඇසින් රූප දැක, කනින් ශබ්ද අසා, නාසයෙන් ගඳ සුවඳ දැන, දිවෙන් රස දැන, ශරීරයෙන් ස්පර්ශ ලබා, මනසින් අරමුණු ගෙන නොඇලුන සේක, නැවත නූපදින පරිදි කෙලෙස් 1500 ක් දුරු කළ සේක.

★ මාගේ ස්වාමී වූ බුදු පියාණන් වහන්සේගේ ............ ඒ අරහං බුදු ගුණ බලය සත්‍යයි. ඒ සත්‍යානුභාවයෙන් මම නිදුක් වෙම්වා! නිරෝගි වෙම්වා! සුවපත් වෙම්වා! දුකින් මිදෙම්වා! නිවන් දකිම්වා !

**සාධු ! සාධු !! සාධු !!!**



## සම්මා සම්බුද්ධ බුදු ගුණය

**සො භගවා ඉතිපි සම්මා සම්බුද්ධො**
**සම්මා සම්බුද්ධො වත සො භගවා**
**තං භගවන්තං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි**
**තං භගවන්තං සම්මා සම්බුද්ධං සිරසා නමාමි**

★ ස්වාමීනි ! භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේ අතීත, වර්තමාන, අනාගත යන තුන් කාලයටම අයත් ධර්මයන් තමන් වහන්සේගේ නුවණින් ම අවබෝධ කර ගත් සේක.

★ රූප, වේදනා, සංඥා, සංඛාර, විඥාන, යන පංච උපාදානස්කන්ධය දුඃඛ සත්‍යය ම බව පිරිසිඳ අවබෝධ කර ගත් සේක.

★ එමදුක උපදවන්නා වූ කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා, යන ත්‍රිවිධ තණ්හාවන් සමුදය සත්‍ය වශයෙන් අවබෝධ කරගත් සේක.

★ අවිද්‍යාව තණ්හාව නොපවත්නා වූ නිර්වාණ ධාතුව නිරෝධ සත්‍ය වශයෙන් අවබෝධ කරගත් සේක.

★ නිර්වාණ ධාතුව අවබෝධ කර ගැනීම සඳහා පිළිපැදිය යුතු මාර්ගය ආර්ය අෂ්ඨාංගික මාර්ගය හෙවත් මාර්ග සත්‍ය වශයෙන් අවබෝධ කරගත් සේක.

★ සංඛාර, විකාර, ලක්ඛණ, ප්‍රඥාප්ති, නිබ්බාන යන පස් වැදෑරුම් නෙය්‍ය ධර්මයන්, ගුරු උපදේස, රහිතව ම තමන් වහන්සේ විසින්ම අවබෝධ කරගත් හෙයින් සම්මා සම්බුද්ධ නම් වන සේක.

★ මාගේ ස්වාමී වූ බුදු පියාණන් වහන්ස ! ඔබ වහන්සේගේ සම්මා සම්බුද්ධ බුදු ගුණ බලය සත්‍යයි. ඒ සත්‍යානුභාවයෙන් මම නිදුක් වෙම්වා! නිරෝගි වෙම්වා! සුවපත් වෙම්වා! දුකින් මිදෙම්වා! නිවන් දකිම්වා !

**සාධු ! සාධු !! සාධු !!!**

## විජ්ජාචරණ සම්පන්න බුදු ගුණය

**සො භගවා ඉතිපි විජ්ජාචරණ සම්පන්නො**
**විජ්ජාචරණ සම්පන්නො වත සො භගවා**
**තං භගවන්තං විජ්ජාචරණ සම්පන්නංතං**
**සරණං ගච්ඡාමි**
**තං භගවන්තං විජ්ජාචරණ සම්පන්නං**
**සිරසා නමාමි.**

★ මාගේ ස්වාමී වූ බුදු පියාණන් වහන්සේ ! අනිත්‍ය, දුඃඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය අවබෝධ කරගන්නා වූ විදර්ශනා ඥානයන්ගෙන් ද,

★ තමන් වහන්සේගේ කයින් අන් කයක් මවාපාන්නා වූ මනෝමය ඍධි විධ ඥානයෙන් ද,

★ අසම සම වූ අනන්ත අපරිමාණ වූ ඍධි ප්‍රාතිහාර්යන් පාන්නා වූ ඍධි ප්‍රාතිහාර්ය ඥානයෙන් ද,

★ මේ ලෝක ධාතුවේ පවතින ඕනෑම කට හඬක් ඒ මොහොතේ ම අසා දැන ගත හැකි නුවණ ඇති දිව්‍ය ශ්‍රෝත ඥානයෙන් ද,

★ අනුන්ගේ සිත් දන්නා වූ නුවණ ඇති පරචිත්ත විජානන ඥානයෙන් ද,

★ පෙර ආත්ම ගැන දන්නා වූ පුබ්බේ නිවාසානුස්මෘති ඥානයෙන් ද,

★ සත්වයින් මැරි මැරී ගොස් උපදිනා තැන දැන ගන්නා වූ දිබ්බ චක්ඛු ඥානයෙන් ද,

★ කාමාශ්‍රව, භවාශ්‍රව, දිට්ඨාශ්‍රව, අවිද්‍යාශ්‍රව ආදී ආශ්‍රවයන් ක්ෂය කරන ආශ්‍රව ක්ෂයකර ඥානයෙන් ද,

★ ප්‍රාතිමෝක්ෂර ශීලය, ඉන්ද්‍රිය සංවර ශීලය පමණ දැන ආහාර වැළඳීම කුශලා කුශල කර්ම කෙරෙහි ඇති ශ්‍රද්ධාව, හිරි ඔතප්, බහු ශ්‍රැත භාවය, වීර්ය, සිහිය, ප්‍රඥාව ධ්‍යාන සතර යන පසළොස් චරණ ධර්මයන්ගෙන් ද සමන්නාගත වන හෙයින්



ඔබවහන්සේ විජ්ජාචරණ සම්පන්න නම් වන සේක.

★ මාගේ ස්වාමී වූ බුදු පියාණන් වහන්ස ! ඔබ වහන්සේගේ ඒ විජ්ජාචරණ සම්පන්න බුදු ගුණ බලය සත්‍යයි. ඒ සත්‍යානුභාවයෙන් මම නිදුක් වෙම්වා! නිරෝගි වෙම්වා! සුවපත් වෙම්වා! දුකින් මිදෙම්වා! නිවන් දකිම්වා !

**සාධු ! සාධු !! සාධු !!!**

## සුගත බුදු ගුණය

**සො භගවා ඉතිපි සුගතො**
**සුගතො වත සො භගවා**
**තං භගවන්තං සුගතං සරණං ගච්ඡාමි**
**තං භගවන්තං සුගතං සිරසා නමාමි.**

★ මාගේ ස්වාමී වූ බුදු පියාණන් වහන්ස ! ඔබ වහන්සේ දීපංකර බුද්ධ ශ්‍රී පාද මූලයේ පටන් විජය ශ්‍රී ජය ශ්‍රී බෝ මැඩ දක්වාම ශාන්ත ගමනින් පැමිණි හෙයින් ද,

★ දෙතිස්මහා පුරුෂ ලක්ෂණයෙන් යුක්ත වන හෙයින් ද, මනහර ප්‍රතිපත්ති මාලාවකින් යුක්ත වන හෙයින් ද,

★ කාම සුඛල්ලිකානු යෝගය, අත්තකිලමතානු යෝගය යන අන්ත දෙකට නොපැමිණ මධ්‍යම ප්‍රතිපදාවෙන් උතුම් වූ චතුරාර්ය සත්‍ය අවබෝධ කරගත් හෙයින් ද,

★ සත්‍ය වූ ද, සාරවත් වූ ද, අර්ථවත් වූද මුල මැද අග යහපත් වූ අසූ හාරදහසක් ධර්මස්කන්ධය දේශනා කළ හෙයින් මාගේ ස්වාමී වූ බුදු පියාණන් වහන්සේ සුගත නම් වන සේක,

★ මාගේ ස්වාමී වූ බුදු පියාණන් වහන්ස ! ඔබ වහන්සේගේ ඒ සුගතො බුදු ගුණ බලය සත්‍යයි. ඒ සත්‍යානුභාවයෙන් මම නිදුක් වෙම්වා! නිරෝගි වෙම්වා! සුවපත් වෙම්වා! දුකින් මිදෙම්වා! නිවන් දකිම්වා !

**සාධු ! සාධු !! සාධු !!!**

## ලෝක විදූ බුදු ගුණය

**සො භගවා ඉතිපි ලෝක විදූ**
**ලෝකවිදූ වත සො භගවා**
**තං භගවන්තං ලෝකවිදූං සරණං ගච්ඡාමි**
**තං භගවන්තං ලෝකවිදූං සිරසා නමාමි**

- ★ මාගේ ස්වාමී වූ බුදු පියාණන් වහන්සේ ! ලෝකය, ලෝක සමුදය, ලෝක නිරෝධය, ලෝක නිරෝධ ගාමිණී ප්‍රතිපදා මාර්ගය ද,

- ★ සත්ත්ව ලෝකය, සංස්කාර ලෝකය, අවකාශ ලෝකය, යන ලෝකාත්‍රයන්ද,

- ★ අපාය භූමි සතර, කාම භූමි සත, රූප භූමි 16, අරූප භූමි සතර යන තිස් එක් භූමි තලයන් සහ අවශේෂ ලෝක ධාතූන් සම්මුති, පරමාර්ථ වශයෙන් අවබෝධ කරගත් හෙයින් මාගේ ස්වාමී වූ බුදු පියාණන් වහන්සේ ලෝක විදූ නම් වන සේක.

- ★ මාගේ ස්වාමී වූ බුදු පියාණන් වහන්ස ! ඔබ වහන්සේගේ ඒ ලෝක විදූ බුදු ගුණ බලය සත්‍යයි. ඒ සත්‍යානුභාවයෙන් මම නිදුක් වෙම්වා! නිරෝගි වෙම්වා! සුවපත් වෙම්වා! දුකින් මිදෙම්වා! නිවන් දකිම්වා !

**සාධු ! සාධු !! සාධු !!!**

## අනුත්තරෝ පුරිස දම්ම සාරථී බුදු ගුණය

**සො භගවා ඉතිපි අනුත්තරො පුරිසදම්ම සාරථී**
**අනුත්තරො පුරිසදම්ම සාරථී වත සො භගවා**
**තං භගවන්තං අනුත්තරං පුරිසදම්ම සාරථිං සරණං ගච්ඡාමි**
**තං භගවන්තං අනුත්තරං පුරිසදම්ම සාරථිං සිරසා නමාමි**

- ★ මාගේ ස්වාමී වූ බුදු පියාණන් වහන්ස! ඔබ වහන්සේ ප්‍රාතිමෝක්ෂර සංවර ශීලය, ආජීව පාරි ශුද්ධ ශීලය, ප්‍රත්‍ය සංනිශ්‍රිත ශීලය, ඉන්ද්‍රිය සංවර ශීලය ආදී චතුර්විධ ශීලයන්ගෙන් ද



- ★ ශීල විසුද්ධිය, දිට්ඨි විසුද්ධිය, චිත්ත විසුද්ධිය, කංඛා විතරණ විසුද්ධිය, මග්ගා මග්ග ඥාන දර්ශන විසුද්ධිය, ඥාන දර්ශන විසුද්ධිය ආදී සප්ත විසුද්ධියෙන් ද,

- ★ ශීලයෙන්, සමාධියෙන්, ප්‍රඥාවෙන්, විමුක්තියෙන්, විමුක්ති ඥාන දර්ශනයෙන් ද

- ★ ලොව කිසිවෙකුටත් දමනය කළ නොහැකි වූ චණ්ඩ වූ, පරුෂ වූ, ජෛනයන්, ජටිලයන්, තීර්ථකයන් දෙවියන්, බඹුන්, මිනිසුන්, ප්‍රාතිහාර්ය ඥානයෙන්, උපාය මාර්ගයෙන්, මහා කරුණාවෙන්, මහා ප්‍රඥාවෙන් දමනය කළ හෙයින් අනුත්තරෝ පුරිස දම්ම සාරථී නම් වන සේක.

- ★ මාගේ ස්වාමී වූ බුදු පියාණන් වහන්ස ! ඔබ වහන්සේගේ ඒ අනුත්තරෝ පුරිස ධම්ම සාරථී බුදු ගුණ බලය සත්‍යයි. ඒ සත්‍යානුභාවයෙන් මම නිදුක් වෙම්වා! නිරෝගි වෙම්වා! සුවපත් වෙම්වා! දුකින් මිදෙම්වා! නිවන් දකිම්වා !

**සාධු ! සාධු !! සාධු !!!**

## සත්ථා දේව මනුස්සානං බුදු ගුණය

**සො භගවා ඉතිපි සත්ථා දේව මනුස්සානං**
**සත්ථා දේව මනුස්සානං වත සො භගවා**
**තං භගවන්තං සත්ථාරං දේව මනුස්සානං සරණං ගච්ඡාමි**
**තං භගවන්තං සත්ථාරං දේව මනුස්සානං සිරසා නමාමි**

- ★ මාගේ ස්වාමී වූ බුදු පියාණන් වහන්ස ! ඔබ වහන්සේ දෙවි මිනිසුන්ගේ මෙලොව පරලොව යහපත සඳහා චතුරාර්ය සත්‍ය දේශනා කළ හෙයින් ද,

- ★ ලෝභ, ද්වේශ, මෝහ, මාන, දිට්ඨි යන කෙලෙස් දුරු කිරීම පිණිස ද,

- ★ දාන, ශීල, භාවනා කුසල විපාකයන් සඳහා ද
- ★ පස් පව්, දශ අකුසල්, පංච නීවරණයන් දුරු කිරීම සඳහා ද,

- ජාති, ජරා, ව්‍යාධි, මරණයන් ඉක්මවීම සඳහා ද
- දෙව් මිනිසුන්ට චතුරාර්ය සත්‍ය අවබෝධ කරවීම සඳහා ධර්මය දේශනා කළ හෙයින් සත්ථා දේව මනුස්සානං වන සේක.

- මාගේ ස්වාමී වූ බුදු පියාණන් වහන්ස ! ඔබ වහන්සේගේ ඒ සත්ථා දේව මනුස්සානං බුදු ගුණ බලය සත්‍යයි. ඒ සත්‍යානුභාවයෙන් මම නිදුක් වෙම්වා! නිරෝගී වෙම්වා! සුවපත් වෙම්වා! දුකින් මිදෙම්වා! නිවන් දකිම්වා !

**සාධු ! සාධු !! සාධු !!!**

## බුද්ධො බුදු ගුණය

**සො භගවා ඉතිපි බුද්ධො**
**බුද්ධො වත සො භගවා**
**තං භගවන්තං බුද්ධං සරණං ගච්ඡාමි**
**තං භගවන්තං බුද්ධං සිරසා නමාමි**

- මාගේ ස්වාමී වූ බුදු පියාණන් වහන්සෙ ! ඔබ වහන්සේ දුකය, දුක ඇතිවීමය, දුක නිවීමය, දුක නිවිමේ මාර්ගය යන චතුරාර්ය සත්‍යය, සත්‍ය ඥාන, කෘත්‍ය ඥාන, කෘත ඥාන ආදී වශයෙන් දොළොස් ආකාරයකින් ද,

- පිළන, සංඛත, සංතාප, විපරිනාම යන දුඃඛාර්ථ සතරකින් ද
- ආයුහන, නිදාන, සංයෝග, පළිබෝධ යන සමුදයාර්ථයන් සතරකින් ද,

- නිස්සරණ, විවේක, අසංඛත, අමත යන නිරෝධාර්ථයන් සතරින් ද,

- නියය්‍යායන, හේතු, දස්සන, ආධිපත්ත්‍ය යන මාර්ගාර්ථයන් සතර යන චතුරාර්ය සත්‍ය ධර්මයෙන් දොළොස් ආකාරයකින් අවබෝධ කර දේශනා කළ හෙයින් ද,

- අත්ථ පටිසම්භිදෙ, ධම්ම පටිසම්භිදෙ, නිරුක්ති පටිසම්භිදෙ, පටිභාන පටිසම්භිදෙ යන චතු විශාරද ඥානයෙන් ද,



- ඉන්ද්‍රිය පරෝ පර්යත්තෙ ඥානය, යමක පටිහාරියේ ඥානය, මහා කරුණා සමාපත්ති ඥානය, සබ්බඤ්ඤු ඥානය, අනාවරණ ඥානය යන ෂට් අසාධාරණ ඥානයන්ගෙන් ද,

- නව අරහාදී බුදුගුණ බලයෙන් ද, දශබල ඥාන බලයෙන් ද, සුවිසි ප්‍රත්‍යය ඥාන බලයෙන් ද, තෙසැත්තෑ ඥානයෙන් ද, සත් සත්තෑ ඥානයෙන් ද, අනන්ත අප්‍රමාණ වූ ඥානයන්ගෙන් සමන්නාගත වන හෙයින් බුද්ධ නම් වන සේක.

- මාගේ අමාමෑණි බුදු පියාණන් වහන්ස ! ඔබ වහන්සේගේ ඒ බුද්ධො බුදුගුණ බලය සත්‍යයි. ඒ සත්‍යානුභාවයෙන් මම නිදුක් වෙම්වා! නිරෝගී වෙම්වා! සුවපත් වෙම්වා! දුකින් මිදෙම්වා! නිවන් දකිම්වා !

**සාධු ! සාධු !! සාධු !!!**

## භගවා බුදු ගුණය

**සො භගවා ඉතිපි භගවා**
**භගවා වත සො භගවා**
**තං භගවන්තං භගවන්තං සරණං ගච්ඡාමි**
**තං භගවන්තං භගවන්තං සිරසා නමාමි**

- මාගේ අමාමෑණි බුදු පියාණන් වහන්සෙ ඔබ වහන්සේ ඓශ්චර්ය භාග්‍ය, කාම භාග්‍ය, යස භාග්‍ය, ශ්‍රී භාග්‍ය, ධර්ම භාග්‍යය, ප්‍රයත්න භාග්‍ය යන භාග්‍යයන් ගෙන්ද,

- ක්ලේශ මාර, අභිසංස්කාර මාර, ස්කන්ධ මාර, දේවපුත්‍ර මාර, මච්චු මාර, යන මාරයන් පරාජය කළ හෙයින් ද,

- ස්කන්ධ, ධාතු, ආයතන, සත්‍ය, ඉන්ද්‍රිය, පටිච්ච සමුප්පාද ධර්ම, දශ අකුසල ධර්ම, දශ කුසල ධර්ම, දස සංයෝජන ධර්ම, දශ පාරමිතා, දශ සංඥා, සහ පංච නීවරණ ධර්මයන් මනාකොට අවබෝධ කළ හෙයින් ද

- සතර සතිපට්ඨානය, සතර ඍධිපාද, සතර සම්‍යක් ප්‍රධාන වීර්ය, පංච බල, පංච ඉන්ද්‍රිය, සප්ත බොජ්ඣංග ආර්ය අෂ්ඨාංගික

මාර්ග යන සත් තිස් බෝධි පාක්ෂික ධර්මයන් අවබෝධ කළ හෙයින් ද,

★ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා, දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාවය, ත්‍රිවිධ චර්යා සහ පංච මහා දානයන්ගෙන් ද,

★ භජනය කළ යුතු ගුණයන් භාජනය කළ හෙයින් ද, විභාග කළයුතු සියළු ධර්මයන් විභාග කළ හෙයින් ද, මාගේ ස්වාමී වූ බුදු පියාණන් වහන්සේ භගවා නම් වන සේක.

★ මාගේ ස්වාමී වූ බුදු පියාණන් වහන්ස ! ඔබ වහන්සේගේ ඒ භගවා බුදු ගුණ බලය සත්‍යයි. ඒ සත්‍යානුභාවයෙන් මම නිදුක් වෙම්වා! නිරෝගි වෙම්වා! සුවපත් වෙම්වා! දුකින් මිදෙම්වා! නිවන් දකිම්වා !

**සාධු ! සාධු !! සාධු !!!**

★ මාගේ ස්වාමී වූ බුදු පියාණන් වහන්සේගේ නවඅරහාදී බුදු ගුණ බලය සත්‍යයි. ඒ සත්‍යානුභාව බලයෙන් මම නිදුක් වෙම්වා! නිරෝගි වෙම්වා! සුවපත් වෙම්වා! දුකින් මිදෙම්වා! නිවන් දකිම්වා !

**ඒ අසීමිත ගුණස්කන්ධයට දොහොත් මුදුනත තබා**
**මම නමස්කාර කරමි.**

**මාගේ නමස්කාරය වේවා ! මාගේ ජීවිතය පූජා කරමි.**
**පූජා වේවා ! ග්‍රන්ථය සම්පාදනය කළ**
**අතිපූජනීය නා උයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේට**
**උතුම් බුදු බව ලැබේවා ! යි මෙන් සිතින් ප්‍රාර්ථනා කරමු.**

**සාධු ! සාධු !! සාධු !!!**



# සත් බුදු පිරිත

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස !!!**

**විපස්සි භගවා අරහං සම්මා සම්බුද්ධො අනන්ත පුඤ්ඤො,**
**අනන්ත ඤාණො, අනන්ත ගුණො, අනන්ත තෙජෝ,**
**අනන්ත ඉද්ධි, අනන්ත ජුති**
**සිඛී භගවා අරහං සම්මා සම්බුද්ධො අනන්ත පුඤ්ඤො,**
**අනන්ත ඤාණො, අනන්ත ගුණො, අනන්ත තෙජෝ,**
**අනන්ත ඉද්ධි, අනන්ත ජුති**
**වෙස්සභූ භගවා අරහං සම්මා සම්බුද්ධො අනන්ත පුඤ්ඤො,**
**අනන්ත ඤාණො, අනන්ත ගුණො, අනන්ත තෙජෝ,**
**අනන්ත ඉද්ධි, අනන්ත ජුති**
**කකුසන්ධො භගවා අරහං සම්මා සම්බුද්ධො අනන්ත පුඤ්ඤො,**
**අනන්ත ඤාණො, අනන්ත ගුණො, අනන්ත තෙජෝ,**
**අනන්ත ඉද්ධි, අනන්ත ජුති**
**කෝණාගමනො භගවා අරහං සම්මා සම්බුද්ධො අනන්ත පුඤ්ඤො,**
**අනන්ත ඤාණො, අනන්ත ගුණො, අනන්ත තෙජෝ,**
**අනන්ත ඉද්ධි, අනන්ත ජුති**
**කස්සපො භගවා අරහං සම්මා සම්බුද්ධො අනන්ත පුඤ්ඤො,**
**අනන්ත ඤාණො, අනන්ත ගුණො, අනන්ත තෙජෝ,**
**අනන්ත ඉද්ධි, අනන්ත ජුති**
**අම්හාකං ගෝතමො භගවා අරහං සම්මා සම්බුද්ධො අනන්ත පුඤ්ඤො, අනන්ත ඤාණො, අනන්ත ගුණො, අනන්ත තෙජෝ,**
**අනන්ත ඉද්ධි, අනන්ත ජුති**
**සත්තිමෙ බුද්ධා භගවන්තෝ අරහන්තෝ සම්මා සම්බුද්ධා අනන්ත පුඤ්ඤො, අනන්ත ඤාණො, අනන්ත ගුණො, අනන්ත තෙජෝ,**
**අනන්ත ඉද්ධි, අනන්ත ජුති**

අනන්ත ඉද්ධිමන්තා, අනන්ත ජුතිමන්තා, මයිහං නාථා,

මයිහං දීපා. මයිහං තාණා, මයිහං ලේනා, මයිහං පතිසරණා

අනන්ත පුඤ්ඤෝ බුද්ධා භගවන්තො අනන්තෙහි පුඤ්ඤ

චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා

අනන්ත ඤාණා බුද්ධා භගවන්තො අනන්තෙහි ඤාණ

චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා

අනන්ත ගුණා බුද්ධා භගවන්තො අනන්තෙහි ගුණ

චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා

අනන්ත තෙජා බුද්ධා භගවන්තො අනන්තෙහි තෙජ

චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා

අනන්ත ජුතිමන්තා බුද්ධා භගවන්තො අනන්තෙහි ජුති

චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා

සබ්බේ මහිද්ධිකා සම්මා සම්බුද්ධා සබ්බෙහි සම්මා සම්බුද්ධ

චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා

සබ්බේ මහිද්ධිකා පච්චේක සම්බුද්ධා සබ්බෙහි පච්චෙක සම්බුද්ධ

චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා

සබ්බේ මහිද්ධිකා ඛීණාසවා අරහන්තෝ සබ්බෙහි අරහන්ත

චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා

සබ්බේ මහිද්ධිකා අරියා සබ්බෙහි අරිය චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා

සබ්බේ මහිද්ධිකා දේවා සබ්බේහි දේව චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා

සබ්බේ මහිද්ධිකා ඉන්‍ද්‍ර සබ්බේහි ඉන්‍ද්‍ර චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා

සබ්බේ මහිද්ධිකා බ්‍රහ්මා සබ්බේහි බ්‍රහ්ම චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා

සබ්බේ මහිද්ධිකා නාගා සබ්බේහි නාග චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා

සබ්බේ මහිද්ධිකා ගරුළා සබ්බේහි ගරුළ චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා

සබ්බේ මහිද්ධිකා යක්ඛා සබ්බේහි යක්ඛ චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා

සබ්බේ මහිද්ධිකා රක්ඛසා සබ්බේහි රක්ඛස චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා





සබ්බේ මහිද්ධිකා ගන්ධබ්බා සබ්බේහි ගන්ධබ්බ චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා සබ්බේ මහිද්ධිකා කුම්භණ්ඩා සබ්බේහි කුම්භණ්ඩ, චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා සබ්බේ සම්මා සම්බුද්ධා සබ්බේ පච්චේක සම්බුද්ධා සබ්බේ ඛීණාසවා අරහන්තො සබ්බේ අරියා සබ්බේ දේවා සබ්බේ ඉන්‍ද්‍ර සබ්බේ බ්‍රහ්මා සබ්බේ නාගා සබ්බේ ගරුළා සබ්බේ යක්ඛා සබ්බේ රක්ඛසා සබ්බේ ගන්ධබ්බා සබ්බේ කුම්භාණ්ඩා මං රක්ඛන්තු සබ්බදා

## සත් බුදු පිරිතෙහි සත්‍ය බලන ක්‍රමය :-

අළුයම 05.00 ටත් 06. 00 ටත් අතර කාලයේ නොපිපුණු නෙළුම් කැකුලක් ගෙන 108 වරක් මෙයින් පිරිත් කළ කල්හි එය පුබුදු වී තමන් ඉන්න දෙසට නැමේ, අත්දුටුවයි.

සීලයෙහි පිහිටා තෙරුවන් නැමද මේ පිරිත සජ්ඣායනා කළ යුතුය. අනුන්ට කියන විට **මයිහං** යන තැනට **තුයිහං** කියාද මං යන තැනට **ත්වං** කියාද යෙදිය යුතුය. මෙයින් 108 වර පිරෙන විට පුදුම ගුණ ලැබේ. වනගතව විවේකීව භාවනා වඩන යෝගී උතුමන් උදෙසාම විශේෂයෙන් සකස් කරන ලද්දකි. මෙයින් සියලු අමනුෂ්‍ය භය රෝග භය අපල උපද්‍රවාදිය දුරුවී දේවාරක්ෂාව ලැබේ. කුඩා දරුවන්ට විශේෂයෙන් ඵලදායි වේ.

බලන්ගොඩ බුදුන්වෙල හාමු මහතා වෙතින් පූජනීය රාජකීය පණ්ඩිත මාතර ශ්‍රී ඥාණාරාම මහෝපාධ්‍යාය මාහිමියන් වහන්සේට ලැබුණු පිරිතකි.